# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජූලි මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 11.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත

[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 25/2008.

**සන්නද්ධ හමුදා හා ආරක්ෂක අමාත්‍යාංශය අතර කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිව යුතු වූ ද ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී විය යුතු වූ ද තැනැත්තකු පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කමිටුව පිහිටුවීම සඳහා ද ; ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ කර්තව්‍ය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** (1) මේ පනත 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ අනිකුත් විධිවිධාන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක හෝ දිනයන්හි දී බලාත්මක වන්නේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව ප්‍රකාර පනත් කෙටුම්පත මත කථානායකවරයාගේ සහතිකය සටහන් කරනු ලැබූ දිනයේ දී මේ වගන්තියේ විධිවිධාන බලාත්මක වන්නේ ය.

(3) මේ පනතේ විධිවිධාන හෝ කොටස් බලාත්මක වීමේ දින වශයෙන් විවිධ දිනයන් නියම කරනු ලැබිය හැකි ය.

## I වන කොටස

### ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පත් කිරීම

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පත් කිරීම.

**2.** (1) ජනාධිපතිවරයා විසින් අවස්ථාවෝචිත පරිදි වර්තමාන යුද හමුදාපතිවරයා, නාවික හමුදාපතිවරයා හෝ ගුවන් හමුදාපතිවරයා අතරින් එක් නිලධරයකු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (මෙහි මින් මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ විධානය, අධීක්ෂණය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, යුද හමුදාපතිවරයා, නාවික හමුදාපතිවරයා හෝ ගුවන් හමුදාපතිවරයා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක දී, එසේ පත් කරනු ලැබීමෙන් පසුව ඔහු විසින් අවස්ථාවෝචිත පරිදි තමාගේ යුද හමුදාපති, නාවික හමුදාපති හෝ ගුවන් හමුදාපති තත්ත්වය අත්හරිනු ලැබිය යුතු ය:

එසේ වුව ද, (357 වන අධිකාරය වූ) යුද හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස පත් වූ තැනැත්තා එම ධුරය දරන තාක් (1) වන උපවගන්තිය යටතේ එම ධුරයට පත් වූ දිනයේ දී ඔහු අයත් වූ නිත්‍ය හමුදා සේවයෙහි සාමාජිකයකු වශයෙන් වූ තත්ත්වය අඛණ්ඩව දැරිය යුතු ය:

එසේම තවදුරටත්, අවස්ථාවෝචිත පරිදි, යුද හමුදාපතිවරයා හෝ නාවික හමුදාපතිවරයා හෝ ගුවන් හමුදාපතිවරයා වශයෙන් ස්වකීය තත්ත්වය ඒ නිලධරයා විසින් අත්හරිනු ලැබූ විට, (357 වන අධිකාරය වූ) යුද හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ කුමක් සඳහන් වුව ද එය නොතකා, ඒ පත්වීමට පෙරාතුව ඔහු අයත් වූ නිත්‍ය හමුදා සේවයේ අනුරූප සේවාවේ සාමාජිකයකු වශයෙන් එසේ පත් කරනු ලැබූ ඒ නිලධරයා අඛණ්ඩව සිටින බවට සලකනු ලැබිය යුතු ය.

(4) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී විසින් තමා එසේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරයේ සේවය කරන අතරතුර දී, යුද හමුදා නිලධරයකු සම්බන්ධයෙන් වන විට ජෙනරාල්වරයකුගේ තත්ත්වය ද, නාවික හමුදා නිලධරයකු සම්බන්ධයෙන් වන විට අද්මිරාල් තත්ත්වය ද, ගුවන් හමුදා නිලධරයකු සම්බන්ධයෙන් වන විට එයාර් චීෆ් මාෂල් තත්ත්වය ද දරන්නේ ය.

3. (1) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී විසින්, ජනාධිපතිවරයාගේ කැමැත්තට යටත්ව අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු ය.

ආරක්ෂක මාණ්ඩලික නිලධාරීන්ගේ ධුර කාලය යනාදිය.

(2) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස සේවය කරන නිලධරයකු තවත් වසර දෙකක් සඳහා එවැනි ම ආකාරයට නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය :

එසේ වුව ද, එම වසර දෙකක කාල සීමාව එක් වරකට වසර එකක් සඳහා වූ නැවත පත් කිරීම් මගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ; එහෙත් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ මුළු ධුර කාලය සමස්තයක් වශයෙන් වසර හතරක් නොඉක්මවිය යුතු ය :

එසේ ම තවදුරටත් පොදු හදිසි අවස්ථාවක දී ජනාධිපතිවරයා විසින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස සේවය කරමින් සිටින නිලධරයා තවත් ධුර කාල යම් ගණනාවක් සඳහා නැවත පත් කරනු ලැබිය හැකි ය.

(3) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරය දරන තැනැත්තා විසින් තමාගේ ධුර කාලය ඉකුත් වීමට පෙර ඕනෑම අවස්ථාවක තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරයෙන් ඉල්ලා අස්වීම භාරදෙනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, තම ඉල්ලා අස්වීම භාරදෙනු ලබන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වෙත, ජනාධිපතිවරයා විසින් ලිඛිතව එකී ඉල්ලා අස්වීම භාරගත් බවට නිවේදනයක් කරනු ලබන තෙක්, ඔහුගේ ධුරයේ කාර්යය වලින් ඔහු නිදහස් නොවිය යුතු ය.

(5) මිය යෑම, විශ්‍රාම යෑම, ඉල්ලා අස්වීම අශක්නුතාව හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුර කාලය ඉකුත් වීමට පෙරාතුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් මේ වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ ධුරය සඳහා වෙනත් නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ එසේ පත් කරනු ලැබූ නිලධරයා, තමා අනුප්‍රාප්ත වන එකී නිශ්චිත ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) මිය යෑම, විශ්‍රාම යෑම, ඉල්ලා අස්වීම, අශක්නුතාව හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරයේ පුරප්පාඩුවක් පවතින අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කමිටුවේ සාමාජිකයන් අතරින් එක් අයකු, අවස්ථාවෝචිත පරිදි යුද හමුදාපතිවරයාගේ, නාවික හමුදාපතිවරයාගේ හෝ ගුවන් හමුදාපතිවරයාගේ ධුරයෙහි කර්තව්‍යවලට අමතරව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ ධුරයෙහි කාර්යය සහ කර්තව්‍ය තාවකාලිකව ඉටු කිරීම සඳහා අනුප්‍රාප්තිකයා පත් කරනු ලබන තෙක් හෝ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සේවයට නොපැමිණි අවස්ථාවක දී හෝ තාවකාලික අශක්නුතාවකට පත් වී ඇති අවස්ථාවක ඔහු ධුරය දැරීම සඳහා ආපසු පැමිණෙන තෙක් හෝ අශක්නුතාව අවසන් වන තෙක්, නම් කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එසේ නම්කරන ලද ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කමිටුවේ සාමාජිකයකු, අවස්ථාවෝචිත පරිදි, අනුප්‍රාප්තිකයකු නම් කරනු ලබන තෙක් හෝ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරයට නැවත වාර්තා කරනු ලබන තෙක් හෝ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ ධුරයෙහි කාර්යය සහ කර්තව්‍ය ඉටු කළ යුතු ය.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ඉවත් කිරීම.

**4.** ජනාධිපතිවරයා විසින් ඕනෑම අවස්ථාවක දී ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලු සැලකිල්ලට ගෙන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ඒ සඳහා හේතු දැක්වීමකින් තොරව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ කර්තව්‍ය.

**5.** ලේකම්වරයාගේ අධිකාරයට, විධානයට, පාලනයට සහ අධීක්ෂණයට යටත්ව, පහත දැක්වෙන කර්තව්‍ය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී විසින් කළ යුතු ය:—

(අ) සන්නද්ධ හමුදාවලට ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සඳහා සහාය වීම;

(ආ) සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ සේවා නියුක්තිය සඳහා වූ න්‍යායක් වර්ධනය කිරීම;

(ඇ) සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීම සඳහා පහසුකම් සැලැස්වීම;

(ඈ) සන්නද්ධ හමුදා අතර බුද්ධිමය අංශයට අදාළ කර්තව්‍යයන් සම්බන්ධයෙන් වූ කාරණා සම්බන්ධීකරණය කිරීම;

(ඉ) සන්නද්ධ හමුදාවල ඉදිරි ප්‍රතිවාදීන් සමග සංසන්දනය කිරීමේ දී ඔවුන්ගේ ශක්‍යතාවය නිශ්චය කිරීම සඳහා වූ තක්සේරු කිරීම් භාර ගැනීම;

(ඊ) සන්නද්ධ හමුදා මෙහෙයුම්වල සැලසුම් සකස් කිරීමට පහසුකම් සැලසීම සහ සන්නද්ධ හමුදා අතරේ ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම;

(උ) සන්නද්ධ හමුදාවලට අදාළ අහඹු සැලසුම් සකස් කිරීම සහ සමාලෝචනය කිරීම;

(ඌ) තීරණාත්මක ඌනතා සහ ශක්තීන් පිළිබඳ උපදෙස් දීම සහ—

(i) ජාතික ආරක්ෂක අරමුණු කරා ළඟා වීමේ දී; සහ

(ii) ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කරන බවට වග බලා ගැනීමේ දී,

එවැනි ඌනතා සහ ශක්තීන්වල බලපෑම තක්සේරු කිරීම;

(එ) ක්‍රමෝපාය සැලසුම්වලට අදාළව මුදල් වර්ෂයක් සඳහා සන්නද්ධ හමුදාවල වැඩසටහන්, නිර්දේශ හා අයවැය යෝජනා පිළිගත් ප්‍රමුඛ කරුණුවලට කොතෙක් දුරට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව උපදෙස් දීම;

(ඒ) මිනිස් බලය උපකරණවලට අදාළව, සන්නද්ධ හමුදාවල මහා පරිමාණ වැඩසටහන් හා ප්‍රතිපත්ති කොතෙක් දුරට ක්‍රමෝපාය සැලසුම්වලට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව උපදෙස් දීම;

(ඔ) යෝජිත ආරක්ෂක ප්‍රසම්පාදන සැලසුම්වලට එරෙහිව යුදමය අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ ඒ අනුව අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ඕ) සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ පුහුණු වීම් සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම;

(ඇ) සන්නද්ධ හමුදා විසින් සාමසාධක මෙහෙයුම් කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම; සහ

(ග) ඉහත සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා නියම කරනු ලබන හෝ අවශ්‍ය කරන වෙනත් සියලු දේ කිරීම.

## II වන කොටස

### ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කමිටුව

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කමිටුව.

**6.** (1) (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කමිටුවක් මේ පනතේ කාර්යය සඳහා ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය තුළ පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කමිටුව—

(අ) සභාපතිවරයා විය යුතු 2 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගෙන්;

(ආ) යුද හමුදාපතිවරයාගෙන්;

(ඇ) නාවික හමුදාපතිවරයාගෙන්; සහ

(ඈ) ගුවන් හමුදාපතිවරයාගෙන්,

සමන්විත විය යුතු ය.

සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කිරීම් සඳහා පහසුකම් සැලැස්විය යුතු බව.

**7.** (1) යුදමය කාරණාවලට අදාළව අමාත්‍යාංශය සහ සන්නද්ධ හමුදා අතර සියලු කාරණා ක්‍රියාත්මක කිරීම සඳහා සභාපතිවරයා විසින් පහසුකම් සැලැස්විය යුතු ය.

(2) ලේකම්වරයාගේ විධානය සහ අධීක්ෂණයට යටත්ව සභාපතිවරයා විසින් යුද හමුදාපතිවරයා, නාවික හමුදාපතිවරයා සහ ගුවන් හමුදාපතිවරයා විමසා (1) වන උපවගන්තිය යටතේ පැන නගින කර්තව්‍ය ඉටු කළ යුතු ය.

(3) සභාපතිවරයා විසින් යම් කාරණයක් සම්බන්ධයෙන් ස්වකීය කර්තව්‍ය කරගෙන යාමේ දී ඒ කාරණය සම්බන්ධයෙන් ඔහු විසින් සුදුසු යයි සලකන යුදමය උපදෙස් සහ අදහස්වල පරාසයන් සැලකිල්ලට භාජනය කළ යුතු ය.

(4) සභාපතිවරයා විසින් අනිසි ප්‍රමාදයකින් තොරව ස්වකීය උපදෙස් සහ අදහස් ඉදිරිපත් කිරීමට වග බලා ගැනීම සඳහා හැකි උපරිම මට්ටමින් කාර්ය පටිපාටි සකස් කළ යුතු ය.

## III වන කොටස

### කාර්ය මණ්ඩලය

**8.** (1) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය සන්නද්ධ හමුදාවේ පුද්ගලයන් සහ සිවිල් වැසියන් යන දෙපිරිසම අඩංගු වන පරිදි යම් කාර්ය මණ්ඩලයකින් සමන්විත විය යුතු ය. ඒ සම්බන්ධයෙන් අදාළ වන්නා වූ පරිපාලන නියෝගවලට අදාළව දැනට රාජ්‍ය සේවයේ යෙදෙන තැනැත්තන් අතරින් සිවිල් වැසියන් තෝරා ගනු ලැබිය හැකි ය. කාර්ය මණ්ඩලය.

(2) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය සඳහා අවශ්‍ය යයි තීරණය කරනු ලැබුවහොත් තත් කාලයේ බලපවත්නා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලන නියෝග සහ රීතිවලට අනුකූලව ලේකම්වරයා විසින් ද බඳවා ගැනීම් කරනු ලැබිය හැකි ය.

(3) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ සේවා සඳහා සන්නද්ධ හමුදාවේ තැනැත්තකු යොදා ගනු ලබන අවස්ථාවක දී, ඒ යොදා ගැනීම අවස්ථාවෝචිත පරිදි යුද හමුදාපතිවරයා, නාවික හමුදාපතිවරයා හෝ ගුවන් හමුදාපතිවරයා විමසා ලේකම්වරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.

**9.** (1) ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයට රජයේ නිලධරයන් පත් කිරීම.

(2) යම් රජයේ නිලධරයකු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ පත් කිරීමට පෙරාතුව වූ දිනයේ දී ඒ නිලධරයා විසින් භුක්ති විඳිනු ලැබූ නියම සහ කොන්දේසිවලට සහ ඒ පත් කිරීමට අදාළ රජයේ වෙනත් යම් නියමයන්ට, ඒ පත් කිරීම යටත් වන්නේ ය.

(3) රජයේ සේවය කිරීමට එකඟ වී ඇති තැනැත්තකු යම් නිශ්චිත කාලයක් සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ සේවයට යොදවන අවස්ථාවක දී ඒ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ යම් කාල සීමාවක් සඳහා කරන ලද ඒ සේවාව ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආරක්ෂක ප්‍රධානී කාර්යාලයට රාජ්‍ය සංස්ථා නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

**10.** (1) ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි, යම් රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව ඒ සංස්ථාවේ ලේකම්වරයා හෝ පාලක මණ්ඩලය විසින් එකඟ විය හැකි යම් නියම සහ කොන්දේසි මත ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් රාජ්‍ය සංස්ථාවක නිලධරයකු හෝ සේවකයකු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක දී කාර්ය මණ්ඩලයේ අනිකුත් සාමාජිකයන් සම්බන්ධයෙන් බලපවත්නා විනය පාලනයට ම එම තැනැත්තා ද යටත් විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය

නියෝග.

**11.** (1) මේ පනත මගින් නියම කළ යුතු යයි නියමිත හෝ මේ පනත මගින් නියෝග සෑදීම සඳහා බලය දෙනු ලැබ ඇති කරුණු

සම්බන්ධයෙන් හෝ මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) ඉහතින් වූ කරුණුවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ද අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි ය:—

(අ) ඒකාබද්ධ න්‍යාය, පුහුණුව සහ වෘත්තීය හමුදා අධ්‍යාපනය;

(ආ) හමුදා අධ්‍යාපනය සඳහා පිහිටුවා ඇති ආයතනවල පවත්වනු ලැබිය හැකි වැඩ සටහන් සහ පාඨමාලා;

(ඇ) සන්නද්ධ හමුදාවල මෙහෙයුම් හා සම්බන්ධ තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ ගබඩා කිරීම සඳහා සමුදායන් සහ පද්ධති පිහිටුවීම;

(ඈ) සාම සාධක මෙහෙයුම් සඳහා වන ප්‍රතිපත්ති;

(ඉ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද තැනැත්තන්ට අදාළ නියම සහ කොන්දේසි නිශ්චය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ;

(ඊ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරය සඳහා සේවා ලබා ගත හැකි විශේෂඥයන්ගේ සුදුසුකම්;

(උ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය තුළ මානව සම්පත් සංවර්ධනය සඳහා වැඩ සටහන් සහ ව්‍යාපෘති.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති.

**12.** (1) අමාත්‍යවරයා විසින් ලේකම්වරයා විමසා ආරක්ෂාව පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය වන සහ විශේෂයෙන් ම පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:—

(අ) අමාත්‍යාංශයේ සේවය කරන තැනැත්තන් විසින් අඳිනු ලැබිය යුතු නිල ඇඳුම් ද ඇතුළුව ඇඳුම් සංකේතය ;සහ

(ආ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීගේ කාර්යාලයේ සේවය කරන තැනැත්තන්ගේ චර්යාව, කාර්යය සහ කර්තව්‍ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

නියෝග හෝ රීති උල්ලංඝනය කිරීම සඳහා වූ දණ්ඩනය.

**13.** මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බලපැවැත්විය යුතු බව.

**14.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, එය නොතකා මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධානවල සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර, යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත් මෙම පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**16.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ පනතේ—

"සන්නද්ධ හමුදා" යන්නෙන් පිළිවෙලින් (357 වන අධිකාරය වූ) යුද හමුදා පනත, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.